# කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
# முகாமைத்துவக் கணக்காய்வுத் திணைக்களம்
# DEPARTMENT OF MANAGEMENT AUDIT

මුදල් අමාත්‍යංශය | நிதி அமைச்சு | MINISTRY OF FINANCE
මහලේකම් කාර්යාලය, කොළඹ 01 | செயலகம், கொழும்பு 01 | The Secretariat, Colombo 01


මගේ අංකය / எனது இல / My No } DMA/HRD/2021/TRAINING

ඔබේ අංකය / உமது இல / Your No }

දිනය / திகதி / Date } 2021.10.26

ලේකම්,

ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යංශය,

දිස්ත්‍රික් ලේකම්,

කොළඹ, ගම්පහ, කළුතර සහ ත්‍රිකුණාමලය

<u>අභ්‍යන්තර විගණන නිලධාරීන් සඳහා වන පුහුණු වැඩසටහන</u>

සියලුම අමාත්‍යාංශ, විශේෂ වියදම් ඒකක, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ දෙපාර්තමේන්තුවල ප්‍රධාන අභ්‍යන්තර විගණක, අභ්‍යන්තර විගණක සහ විගණන කාර්ය මණ්ඩල පුහුණු කිරීම කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදුකරන ලදී. එහෙත් Covid – 19 ගෝලීය වසංගත තත්වය හේතුවෙන් පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් ඒකරාශී කිරීම සෞඛ්‍ය මාර්ගෝපදේශවලට පටහැනි වන බැවින් 2021 වර්ෂය තුල පුහුණු වැඩසටහන් පැවැත්වීම සීමා කිරීමට සිදුවිය.

02. දැනට බල පැවැත්වෙන නිලධාරීන් ඒකරාශී කිරීමට ඇති සීමාවන් සැලකිල්ලට ගෙන Zoom තාක්ෂණය භාවිතා කරමින් අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩල පුහුණු කිරීමට මෙම දෙපාර්තමේන්තුව විසින් සැලසුම් කර ඇත. ඒ අනුව 2021.10.27 සහ 28 යන දෙදින පෙ.ව 8.30 සිට ප.ව 1.00 දක්වා ඉහත සඳහන් කාර්යාලවල අභ්‍යන්තර විගණන අංශවලට අනුයුක්ත සහ ඉහත සඳහන් දිස්ත්‍රික්ක 04 හි ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල අභ්‍යන්තර විගණන අංශ වලට අනුයුක්ත සිංහල මාධ්‍ය අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩල සඳහා පුහුණු වැඩසටහනක් පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.

03. මේ වන විට පුහුණු වැඩසටහන් පැවැත්වීමට නියමිත සියලුම කාර්යාල වල අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩල ඇතුලත් කරමින් WhatsApp Group නිර්මාණය කර ඇති අතර පුහුණු වැඩසටහනට අදාල සියලු තොරතුරු (කාල සටහන, දේශන සටහන්, ඇගයීම් පත්‍රිකාව ආදී ) WhatsApp මඟින් නිලධාරීන් වෙත එවීමට කටයුතු කරනු ලැබේ. තවද, Zoom තාක්ෂණය ඔස්සේ මෙම පුහුණු වැඩසටහනට සහභාගී වීමේදී නිලධාරීන් පිළිපැදිය යුතු විශේෂ උපදෙස් මාලාවක්ද WhatsApp මඟින් එවීමට කටයුතු කරනු ලැබේ.


කාර්යාලය / அலுவலகம் / Office } 2484816 2484500 2484600 2484700

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General } 2484543

ෆැක්ස් / பெக்ஸ் / Fax } 2449496

වෙබ් අඩවිය / வெப் சைட் / website } www.treasury.gov.lk

04. මෙම පුහුණු වැඩසටහන තුලින් අදාළ නිලධාරීන්ගේ දැනුම, කුසලතා සහ ආකල්ප වර්ධනය කිරීම සඳහා මහත් පිටුවහලක් ලැබෙන බැවින් පුහුණු වැඩසටහන සඳහා සක්‍රියව සහභාගී වන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබා දෙන්නේ නම් කෘතඥ වෙමි. මේ පිළිබඳව ඔබ කාර්යාලයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන් මේ වන විටත් දැනුවත් කර ඇති අතර ඔවුන් විසින් මෙම කාර්ය මනාව සම්බන්ධීකරණය කරනු ඇතැයි අපේක්ෂා කරමි.

05. මේ පිළිබඳව ඔබ දක්වන සහයෝගය ඉතාමත් අගේ කොට සලකමි.

එස්.ඒ. චන්ද්‍රිකා කුලතිලක
අධ්‍යක්ෂ ජනරාල්